Sannasa
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
**S Jayasinghe**
03 8707 4604
0402 025 516

**Anura Kulasekara**
0431 112 923

**email** ads.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## මැයි දූක

අප මිනිසුන් ලෙද ජීවත් විය යුත්තේ මිනිස් සමාජයට තම යුතුකම් හැකි අයුරින් ඉටු කරමින් බව බොහෝ වියතුන් විවිධ අවස්ථා වලදී ප්‍රකාශ කර ඇති බව අපි දනිමු. එහෙත් ඒ අදහස් ප්‍රායෝගික ලෝකයේදී කෙතරම් දුරට ඉටු වෙමින් පවතිනවාද යන්න ගැටලුවක් බව අප අත්දකින සත්‍යයකි.

එසේම ඉහත අදහස් සැබෑ ලෙසම ක්‍රියාවට නගන්නට උත්සාහ දරන අතලොස්සක් ඉන්නා සමාජයක ඒ මිනිසුන්ගේ වටිනාකම ඉතා ඉහළ ය. තමන් ජීවත් වන සමාජයේ ඇති අඩුපාඩුකම් දැක ඊට පිළියම් යොදන්නට උත්සාහ ගන්නවාද නැත්නම් ඊට වඩා හොඳ සමාජ ක්‍රමයක් ඇති කිරීම වෙනුවෙන් කැප වෙනවාද යන්න නම් දැන් දැන් උභතෝකෝටිකයක් වී හමාරය. දුෂ්කර වුව ද එහි ඇති අභියෝග දුක පීඩනය පූර්ව කර්මයක් ලෙස ඉවසා සිටීමට වඩා ඊට එරෙහිව නව ක්‍රමයක් වෙනුවෙන් කරන කැපවීම සමාජ සංවර්ධන ක්‍රියාදාමයේ අත්‍යවශ්‍ය කාරණයකි.

එහෙත් එවැනි මිනිසුන් ඉතා දුර්ලභ ය. එසේම ඒ දුර්ලභ මිනිසුන් බෙදී වෙන් වී සිටීමද කණගාටුදායක ය. න්‍යායික හෝ වෙනත් කරුණු මත බෙදී වෙන් වී සිටියද මැයි දිනයකදී නිල් කොල කහ දම් පාට කෙසේ වෙතත් ලෙළ දෙන රතු ධජ යටින් ඇදෙන යහපත් සමාජයක් ගොඩනැගීමේ අවංක ප්‍රාර්ථනා සහිත බිම් මට්ටමේ මිනිසුන්ගේ උද්‍යෝගය දැකීමත් සිතට මහත් ආශ්වාදකි. ඒ ගමනේ අවසානයෙහි ඇති දුරස්ථ භාවය ගැන සිහි වීම යනු සිතට මහත් කණගාටුවකි.

## මතක් කරදීමක්

ලියන්නකු හා පත්තරකාරයකු අතර වෙනස ලිවීමේ අරමුණු මත රඳා පවතින බව අපේ විශ්වාසයයි. එකතුකරගත් ලිපි හා ඡයාරූප යොදාගනිමින් අනුග්‍රාහකයන්ගේ ප්‍රදාන හරහා කඩදාසි ගොන්නක් මත අකුරු මුද්‍රණය කිරීම සැබෑ පත්තර කලාව ලෙස යමෙකුට අර්ථ දැක්විය හැකි ය. එසේම ඒ නිසාම ඒ පත්තර කලාව අනියම් ලෙස හැසිරවීමට හා පාලනය කිරීමද පහසු විය හැකි ය. එහෙත් අපට ඊට වෙනස් දැක්මක් තිබේ. එය සත්‍යය ප්‍රකාශකිරීම හා සමාජ වගකීම මත පදනම් වී ඇත .

එසේම අපට නිශ්චිත ඉලක්කද නොමැත. එහෙත් අරමුණු තිබේ. සමාජයක් ලෙස ශ්‍රී ලංකාවේ ජනතාව මුහුණ පා ඇති සංකීර්ණ ගැටලු වලට අදාලවත් අප අපේක්ෂා කරන නිදහස හා සමානාත්මතාව බිහි කිරීම සඳහා මුල් වන සියලු බලවේග තුළට යම් සාධනීය බලපෑමක් කාන්දු කිරීම අපේ ප්‍රධානම අරමුණයි. ඒ ක්‍රියාවලිය විවිධ පුද්ගලයින්ට විවිධ කෝණ වලින් තමන්ගේ මොළයේ පරිමාණයට අනුව අවබෝධ කර ගැනීමේ නිදහස මේ සමාජය තුළ තිබේ. කුමන පුද්ගලයන් කුමනාකාරයෙන් චෝදනා එල්ල කළ ද අපේ අරමුණු සඳහා යන ගමනේ දී මතු වන අභියෝග වලට මුහුණ දීමට අපි නොපැකිළෙන බවද කිසිදු බලවේගයකට අප මෙල්ල කළ නොහැකි බවද දන්වා සිටින්නට කැමැත්තෙමු.

ඒ මන්ද, අප පෙනී සිටින්නේ ජනතාව වෙනුවෙන් බැවිනි.

සංස්කාරක

# සන්නස වසර අටක් සපුරයි




ලංකාවේ දේශපාලනය කරන මාක්ස් ලෙනින්වාදී යැයි කියාගන්නා දේශපාලන පක්ෂ වලට සහ වාමාංශික කියල තමන්ම කියවා ගන්න (වෙන කවුරුවත් නම් කියන්නෙ නැහැ) තනි චූන් ගන්න කීප දෙනාට කටක් ඇරල "සිංහල ජාතිවාදය හා බෞද්ධ ආගම්වාදය පරදවමු" කියල කියන්න බැරි පොඩි අමාරුවක් තියෙනවා.

ඕක ඇඟේම තියෙන අමාරුවක්. ඒ වගේම ඒක ලංකාව ඇතුලෙ දේශපාලනය කරද්දි සිංහල ජාතිවාදන් ට යටවෙලා නන්නත්තාර වෙලා යයි කියල බයට ඒකට කෙළින් විරුද්ධ වෙන්න බැරි කිච්චියට අනෙකුත් සුළු ජාතික පක්ෂ වල තියෙන ජාතිවාදයක් කොනකින් හරි ගාවලා ගන්න තරමට අවස්ථාවාදී වෙනවා.

මේක මතක් වුනේ පහුගිය දවස්වල ජවිපෙ, පෙසප මෙන්ම පෙසප දේශපාලනය පස්සෙ ඇදෙන අවිශිබම ත් මේ අමුතු ජාතිවාදයට එරෙහිව කතා කරල තිබුණා. අවිශිබම ගහපු පෝස්ටරේ තිබුණේ "සියලුම ජාතිවාදයන්ට හා ආගම්වාදයන්ට එරෙහිව පෙළගැසෙමු" මේක තමයි විජේවීරගෙ පරපුරේම සටන් පාඨය. " සියලුම" වචනය නැතුව ඒක කියන්න බයයි.

ලෙනින් ට අනුව පීඩිත පන්තියේ ජාතිකවාදය තුළ තිබෙන මහ ජාතියේ පීඩනයට එරෙහිව නැගී සිටීමේ පොදු ප්‍රජාතාන්ත්‍රික අන්තර්ගතය උදෙසා මාක්ස්වාදීන් කොන්දේසි විරහිතව සහයෝගය දිය යුතුව වෙනවා. පීඩිත පන්තියේ ජාතික වාදය හා මහ ජාතියේ ජාතිකවාදය කියන්නේ දෙකක්. එය වෙන්කර හඳුනාගත යුතු අතර මාක්ස් ලෙනින්වාදීන් හැටියට අප පීඩික මහාජාතියේ ජාතිකවාදයට එරෙහිව සටන් වැදිය යුතු අතර පීඩිතයාගේ අරගලය ජාතිකවාදී වුවද එයට හෝ සහයදිය යුතු වන්නේ නිර්ධන පන්තියේ විමුක්තියක් උදෙසා වූ අරගලයක් නිදහස් නොවූ ජාතියකින් බලාපොරොත්තු විය නොහැක්කක් බැවින්.

පහළ මට්ටමේ සහෝදරයින් පෝස්ටර් ගහනවා ඇරෙන්න වෙන දෙයක් දන්නේ

4 වන පිටට